**ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශීර්ෂයට අදාළ විගණන නිරීක්ෂණ දැක්වේ.

**1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල**

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) | සීතාවක | (ඉ) | මොරටුව | (එ) | ශ්‍රී ජයවර්ධනපුර |
| (ආ) | පාදුක්ක | (ඊ) | දෙහිවල | (ඒ) | කැස්බෑව |
| (ඇ) | රත්මලාන | (උ) | කඩුවෙල | (ඔ) | හෝමාගම |
| (ඈ) | මහරගම | (ඌ) | කොළඹ | (ඕ) | කොලොන්නාව |
| (ක) | තිඹිරිගස්යාය | | | | |

**1.1 විගණන විෂය පථය**

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජුලි 07 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරික්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන් , වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන

පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---------

### 2.1 විසර්ජන ගිණුම

--------------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

------------------------------

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 979 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් රු.මිලියන 787 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු.මිලියන 192 ක් හෙවත් සියයට 20 ක ප්‍රමාණයක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 559 | 541 | 18 | 03.22 |
| මුලධන | 420 | 246 | 174 | 41.43 |
| **එකතුව** | **979** | **787** | **192** | **19.61** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

------------------------------------------------------------------------------------

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 22 ක් හා දෙපාර්තමේන්තු 12 ක් විසින් පිළිවෙලින් රු.මිලියන 5,530 ක් හා රු.මිලියන 2,935 න් වශයෙන් එකතුව රු.මිලියන 8,465 ක ප්‍රතිපාදන සළසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් පිළිවෙලින් රු.මිලියන 4,080 ක් හා රු.මිලියන 2,809 ක් වශයෙන් එකතුව රු.මිලියන 6,889 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සළසා දි තිබුණු ප්‍රතිපාදනයෙන් ඉතිරිය පිළිවෙලින් රු.මිලියන 1,450 ක් හා රු.මිලියන 126 ක් හෙවත් සියයට 26.2 ක් හා සියයට 4.3 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**2.2 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම් | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 25501 | 42 | 37.5 | 32 | 33.9 | 200 | 158 |

**2.3 අග්‍රිම ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු. මිලියන 31.3 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අංක 6003/0000/00/0031/0000/00 දරන තැන්පත් ගිණුමේ රු.මිලියන 694.5 ක ශේෂයක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

3. **ශීර්ෂය 255- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ**

3.1 **ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛණ පවත්වා නොතිබුණු අතර , ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | | අදාල රෙගුලාසිය | නිරික්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. |
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1). | ඇප ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. |
| (ඉ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. |
| (ඊ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | බැරකම් පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. |
| (උ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 විධිවිධාන | ජී.ඒ.එන්.20 ආකෘතිය ප්‍රකාරව උප පත්‍රිකා පොත් ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. |
| (ඌ) | ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත | මුදල් රෙගුලාසි 1647(ඇ) | ඉන්ධන හා ලිහිසිතෙල් තොග පොත පවත්වා නොතිබුණි. |
| (එ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ). | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. |
| (ඒ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | ප්‍රසම්පාදන කමිටුවේ පැමිණීමේ ලේඛණය යාවත්කාලින කර |

| | | | |
|---|---|---|---|
| | කම්ටුවල පැමිණීමේ ලේඛනය | | නොතිබුණි. |
| (ඔ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | ලංසු කැඳවීමේ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

වැය විෂයයන් 02 කට රු.173,216,428 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 ත් සියයට 46 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 4,615 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඉන් රු.මිලියන 3,165 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1,450 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. උපයෝජනය කර තිබුණු රු.මිලියන 3,165 ක ප්‍රතිපාදනවලින් අදාළ අරමුණු ඉටු කර ගෙන ඇති බවට තහවුරු කිරීම සඳහා ඒ පිළිබඳ පසුවිපරම් කිරීමක් සිදු කර නොතිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබුණු රු.මිලියන 2,364 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 2,238 ක් උපයෝජනය කළ පසු රු.මිලියන 126 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**3.3 පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.129,984,587 ක්වූ තැන්පතු 22 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 215(3) විධිවිධානවලට පටහැනිව භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් මාසයේදී රු.2,156,553 ක් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. 2015 පෙබරවාරි 25 දින ඉන් රු.798,980 ක් රජයේ ආදායමට බැර කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමේ පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.694,542,433 ක් ලෙස දක්වා තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුම්වල ශේෂ පිළිවෙලින් රු.471,596,086 ක් හා රු.285,847,719 ක් වශයෙන් එකතුව රු.757,443,805 ක් වි තිබුණි. ඒ අනුව විසර්ජන ගිණුම හා පොදු තැන්පත් ලේඛන අතර වෙනස රු.62,901,372 ක් වි තිබුණි. .

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ ශේෂය රු.285,847,719 ක්ද, පොදු තැන්පත් පාලන ගිණුම අනුව ශේෂය රු.222,946,348 ක්ද හා ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව ශේෂය රු.142,746,286 ක් වි තිබුණි. එම ගිණුම් හා ලේඛන සසදා නොතිබුණි.

(ඉ) ගිණුම් අංක 6003/0000/00/0001/0000/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂයක් නොමැති වුවත් භාණ්ඩාගාර පොත් අනුව රු.10,000,000 ක හර ශේෂයක් විය.

(ඊ) රජයේ ආයතන 06 ක් විසින් විවිධ කාර්යන් සඳහා ලබාදී තිබුණු එකතුව රු.760,903 ක කාර්යභාරයන් ඉටු නොකර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

### 3.4 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

විෂය අංක 25501 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 දින වන විට රු.6,294,253 ක ණය ශේෂ හිඟහිටිව පැවැතුණි. 2015 ජුලි 24 දින වන විට ඉන් රු.1,105,926 ක ණය ශේෂ අයකර ගෙන තිබුණි. ඒ අනුව එදින වන විට රු.5,188,327 ක ණය ශේෂ හිඟහිටිව පැවැතුණි. එම හිඟහිටි ශේෂ මාස 02 සිට වර්ෂ 20 දක්වා කාල පරාසයක සිට පැවැත එන ශේෂ වුවත්, එම ශේෂ අයකර ගැනීමේ කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ආ) වැටුප් රහිතව විදේශගත වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරියකුගෙන් අයවිය යුතු රු.151,381 ක ණය ශේෂය ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 15.10.1 වගන්තිය ප්‍රකාරව අයකර ගෙන නොතිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට වසර 04 කට වඩා අධික කාලයක සිට එම ණය ශේෂය හිඟහිටව පැවැතුණි.

(ඇ) මියගිය හා විශ්‍රාම ගිය නිලධාරින්ගේ හිඟහිටි ණය ශේෂය රු.2,047,451 ක් වි තිබුණි. 2013 වර්ෂය හා සසඳන විට එම ණය ශේෂය රු.1,055,244 කින් හෙවත් සියයට 52 කින් වැඩි වි තිබුණි. ණය ශේෂ තුළ මාස 06 කට වැඩි වර්ෂ 02 කට අඩු කාල පරාසයක අයත් ණය ශේෂවල එකතුව රු.929,267 ක්ද, වර්ෂ 05 කට වැඩි කාලයක අයත් ණය ශේෂ එකතුව රු.297,299 ක් වි තිබුණි. එම ණය ශේෂ අයකර ගැනීම සතුටුදායක තත්ත්වයක නොතිබුණි.

(ඈ) ස්ථාන මාරුවීම් ලබා ගිය, වැඩ තහනම් කළ හා සේවය හැර ගිය නිලධාරින්ගේ වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවැත එන හිඟහිටි ණය ශේෂ එකතුව රු.1,173,100 ක් වි තිබුණි.

(ඉ) 2014 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.156,876,930 ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.158,074,062 ක් වි තිබුණි. ඒ අනුව රු.1,197,132 ක වෙනසක් අනාවරණය විය.

**3.5 වත්කම් කළමනාකරණය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වාදී තිබුණු අතිරික්ත, ඌණතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ii) කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි 2014 දෙසැම්බර් 31 දිනට කර තිබූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලට අනුව භාණ්ඩ ඒකක 61 ක ඌණතාවයක්ද, භාණ්ඩ ඒකක 268 ක අතිරික්තයක්ද, භාණ්ඩ ඒකක 641 ක් ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කිරිමටද කටයුතු කර නොතිබුණි.

(iii) කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි ලේඛන, පොදු 219 හා පොදු 141 දරන ආකෘති පත්‍රද 2014 දෙසැම්බර් 31 දින වන විටත් විධිමත් පරිදි යාවත්කාලීන කර නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 01 ට අඩු කාලයක සිට පැවැත එන බැරකම්වල එකතුව රු.6,334,319 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැය විෂයයන් 11 ක ඉතිරිය රු.1,559,146 ක් වී තිබුණත්, එම ඉතිරිය රු.2,290,510 කින් ඉක්මවා රු.3,849,656 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ii) විසර්ජන ගිණුමේ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ එකතුව රු.136,226 ක බැරකම් අඩුවෙන් සඳහන් කර තිබුණි.

## 3.6 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකර තිබුණු සමහර ගණුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට මහල් 20 කින් යුත් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2001 වර්ෂයේදී රු.මිලියන 1,400 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත සැලැසුම් සකස් කර තිබුණි. මේ සඳහා පළමු අදියර සඳහා රු.මිලියන 815.36 ක්ද, දෙවන අදියර සඳහා රු.මිලියන 445.5 ක් වශයෙන් එකතුව රු.මිලියන 1,260.86 ක් මධ්‍යම ඉංජිනේරු කාර්යාංශය වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 ජනවාරි 15 දින වන විට ගොඩනැගිල්ලේ මහල් 06 ක් පමණක් ඉදිකිරීම් නිම කර තිබුණි.

(ආ) වැඩ ආරම්භ කිරීමට පෙර රු.295,000,000 අත්තිකාරම් ගෙවා වසර දෙකක කාලයක් ඉක්මවී තිබුණත්, වාර්ෂිකව ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම, නිසි පරිදි ප්‍රගති සමාලෝචන කටයුතු සිදු නොවීම හා පසු විපරම් කාර්යයන් සිදු නොවීම යනාදි විවිධ හේතුමත ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු පමා වී තිබුණි.

(ඇ) සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2014 අගෝස්තු 24 දින ලැබී තිබුණද, පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂණ කමිටුවේ අනුමැතිය 2015 ජුලි 15 දින වන විටත් භාණ්ඩාගාරය වෙත ලැබී නොතිබුණි.

(ඇ) 2014 අප්‍රේල් 04, 2014 ජුනි 02, 2014 ඔක්තෝබර් 28 හා 2015 මාර්තු 24 යන දිනවල දිස්ත්‍රික් ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් නිමකළ මහල් 06 පිළිබඳව පැවති සාකච්ඡාව පරිදි අඩුපාඩු කඩිනමින් සකස් කරන ලෙස දන්වා තිබුණද 2015 පෙබරවාරි 27 දින වන විටත් එම අඩුපාඩු සකස් කර නොතිබුණි.

(ඉ) මෙම ගොඩනැගිල්ලේ මළ අපවහන නාලිකා පද්ධතියක් සැකසීමට කිසිදු සැලැසුමක් හා ලිඛිත ගිවිසුමක් නොමැතිව කොළඹ මහ නගර සභාව වෙත 2012 දෙසැම්බර් 31 දින රු.9,932,195 ක් ගෙවා තිබුණි. 2013 දෙසැම්බර් 20 දින රු.8,000,000 ක් ද, 2014 ඔක්තෝබර් 28 දින රු.1,817,535 ක් ද, වශයෙන් එකතුව රු.9,817,535 ක් නගර සභාවෙන් ආපසු ලබාගෙන තිබුණි. ගෙවූ මුදල හා ආපසු ලබාගත් මුදල් අතර රු.114,660 ක වෙනස පුවත් පත් දැන්වීම් සඳහා වූ වියදම් ලෙස කොළඹ මහ නගර සභාව හිලව් කරගෙන තිබුණි. මළ අපවහන නාලිකා පද්ධතියක් 2015 ජූලි 15 දින වන විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය ආශ්‍රිතව සකස් කර නොතිබුණු අතර රජයේ මුදල් නගර සභාවේ වර්ෂ 02 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව රඳවා තබා ගැනිමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉඩ දි තිබුණි.

**3.7 අවිධිමත් ගනුදෙනු**

**---------------------**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලට ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීමේදී වැඩිම මිල ඉදිරිපත් කළ මෙට්‍රොපොලිටන් ආයතනයට කොන්ත්‍රාත්තුව පිරිනමා ඒ සඳහා රු.24,076,616 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(I) අදාළ සියළු භාණ්ඩ පිරිවිතරයන්ට අනුකූලව කොන්ත්‍රාත්කරු විසින් කාර්යාලයට සපයා ඇති බවට වගකිව යුතු නිලධාරියෙකුගේ සහතිකයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ii). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 (අ) හා (ආ) මාර්ගෝපදේශවල විධිවිධාන ඉටු කිරිම සඳහා 8.12.2(අ) හා (ආ) මාර්ගෝපදේශ ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුකූලව අදාල සැපයිම් සිදු කළ බවට ඉංජිනේරුවරයාගේ සහතිකයක් නොතිබුණි.

(iii). කොන්ත්‍රාත්කරු 2013 දෙසැම්බර් 24 දින ඉදිරිපත් කළ ඉන්වොයිසියට අනුව සැපයූ භාණ්ඩවල වටිනාකම ( එකතු කළ අගය මත බදු සමඟ ) රු.17,945,579 ක් වුවද, ගිවිසුම් ප්‍රකාර සැපයූ භාණ්ඩවල එකතු කළ අගය මත බදු සහිත වටිනාකම රු.24,076,616 ක් වී තිබුණි. ඒ අනුව රු.6,131,037 ක වෙනස වෙනුවෙන් කොන්ත්‍රාත්කරු විසින් මාස 04 ක කාල පමාවකින් පසුව 2014 ජුනි 24 දින ඉන්වොයිසියක් ඉදිරිපත් කර තිබුණි.

කොන්ත්‍රාත් ගිවිසුමේ 2.7 ඡේදය අනුව මාස 04 ක කාල පමාවට රු.2,149,897 ක ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(iv). ගිවිසුමට බාහිරව මේස 06 ක් හා හයිබැක් වෙයා එකක් සැපයීම වෙනුවෙන් පිළිවෙලින් රු.1,138,368 ක් හා රු.24,225 ක් ගෙවා තිබුණත්, ඒ සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය නොතිබුණු අතර එම භාණ්ඩ ලද බවට තහවුරුවක්ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 63 | 57 | 06 |
| (ii) තෘතියික මට්ටම | 24 | 19 | 05 |
| (iii) ද්විතීයික මට්ටම | 828 | 589 | 239 |
| (iv) ප්‍රාථමික මට්ටම | 90 | 82 | 08 |
| **එකතුව** | **1,005** | **747** | **258** |